## ගැනිලි ගැලපීම

අයිතිකරු තම පුද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් රැගෙනයන සම්පත් වේ.මෙය දෙයාකාරයකි.

1. මුදල් ගැනිලි
2. භාණ්ඩ ගැනිලි → පිරිවැය මත
   → විකුණුම් මිල මත

### මුදල් ගැනිලි

ගැනිලි ගිණුම හර → මෙය ශේෂ පත්‍රයේ හිමිකම් වලින් අඩු කරයි.

මුදල් ගිණුම බැර → ශේෂ පත්‍රයේ මුදල් වලින් අඩු කරයි.

### භාණ්ඩ ගැනිලි

පිරිවැය මත

ගැනිලි ගිණුම හර → මෙය ශේෂ පත්‍රයේ හිමිකම් වලින් අඩු කරයි

ගැනුම් ගිණුම බැර → ආදායම් ප්‍රකාශයේ ගැනුම් වලින් අඩු කරයි.

මෙහිදී අයිතිකරු විකිණීමට තිබු භාණ්ඩ රැගෙන යාමක් සිදුකරන බැවින් වර්ෂය තුලදී මිලදී ගත් භාණ්ඩ වල වටිනාකමින් අඩු වේ.

විකුණුම් මිල මත

ගැනිලි ගිණුම හර → මෙය ශේෂ පත්‍රයේ හිමිකම් වලින් අඩු කරයි

විකුණුම් ගිණුම බැර → ආදායම් ප්‍රකාශයේ විකුණුම් වලට එකතු කරයි

මෙහිදී අයිතිකරු තම ව්‍යාපාරයේ භාණ්ඩ වෙළඳපලේ විකුණන මිල මත ගැනිලි සිදු කරයි. මෙහිදී විකුණුම් ගිණුම බැර වීමේ අදහස නම් විකුණුම් වැඩි වීමයි.එනම් ව්‍යාපාරය විකුනුමක් සිදු කලා හා සමානය.

❖ 2016.03.31 දිනට ප්‍රමිත ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත උපුටා ගන්නා ලදී.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| ගැනුම් | 60,000 | |
| මුදල් | 40,000 | |
| විකුණුම් | | 70,000 |

අතිරේක තොරතුරු

01. වර්ෂය තුලදී අයිතිකරු තම පුද්ගලික ප්‍රයෝජනය සඳහා රැගෙන ගිය භාණ්ඩ වල වටිනාකම රු. 4,000.

02. වර්ෂය තුල අයිතිකරු තම පුද්ගලික ප්‍රයෝජනය සඳහා රැගෙන ගිය මුදල් වල වටිනාකම රු. 12,000.

03. වර්ෂය තුල අයිතිකරු තම පුද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයේ භාණ්ඩ විකුණුම් මිල මත රු. 30,000 භාණ්ඩ රැගෙන ගියේ ය.

අවශ්‍ය වන්නේ

01. ජර්නල් සටහන්

02. 2016.03.31 දිනට ආදායම් ප්‍රකාශය හා 2016.03.31 ශේෂ පත්‍රයේ උද්ධෘතයන් පිළියෙල කරන්න.

❖ පහත සඳහන් තොරතුරු ද සපයා ඇත.

01. 2016.12.31 දිනට බඩු තොගය රු. 28,000 කට තක්සේරු කර ඇත.

02. 2016.12.31 දිනට ගෙවිය යුතුව තිබු වියදම්

| | |
|---|---|
| විදුලිය | රු.1,200 |
| ප්‍රවාහන ගාස්තු | රු.800 |
| වරිපනම් | රු.400 |

03. ඉදිරි වර්ෂය සඳහා 2016.12.31 දිනට ගෙවා ඇති වියදම් මෙසේය.

| | |
|---|---|
| ප්‍රචාරණය | රු.600 |
| රක්ෂණය | රු.800 |

04. අදාල වර්ෂයට මාස 7ක පමණක් කොමිස් ලැබී ඇත.

ඔබ විසින්

01. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

02. 2016.12.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

- 2016.12.31 දිනට ආකාශ් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමෙන් පහත දෑ උපුටා ගන්නා ලදී.

| | රු. | රු. |
|---|---|---|
| ගැනුම් | | 600,000 |
| ගැනිලි | 36,000 | |

<u>අතිරේක තොරතුරු</u>

වර්ෂය තුල අයිතිකරු රැගෙන ගිය භාණ්ඩ වල වටිනාකම රු. 24,000 මෙතෙක් ගිණුම් පොත් හි සටහන් වී නොමැත.

අවශ්‍ය වන්නේ,

01. ඉහත ගලපිලි ගැලපීමට අදාල ජර්නල් සටහන් දක්වන්න.

02. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුමේ හා 2016.12.31 දිනට ශේෂ පත්‍ර උද්ධෘතයන් පිළියෙල කරන්න.

## <u>ස්ථාවර වත්කම් ක්ෂය ගැලපීම</u>

## ස්ථාවර වත්කම් ක්ෂය ගණනය කිරීමේ ක්‍රම

<u>සරල මාර්ග ක්‍රමය / ස්ථාවර වාරික ක්ෂය ක්‍රමය / පිරිවැය මත ක්ෂය කිරීමේ ක්‍රමය</u>.

මෙම ක්‍රමයේදී සිදුවන්නේ ක්ෂය වීමට භාජනය වන අදාල දේපල පිරියත හා උපකරණයේ පිරිවැය පදනම් කරගෙන එම පිරිවැයෙන් කිසියම් ස්ථාවර වටිනාකමක් වාර්ෂිකව ක්ෂය ලෙස සැලකීමයි.

මෙහිදී ක්ෂය ගණනය කරන ක්‍රම කිහිපයකි.

01. පිරිවැය හා ක්ෂය ප්‍රතිශතය දී ඇති විට.

වාර්ෂික ක්ෂය ප්‍රමාණය= පිරිවැය * ක්ෂය අනුපාතය

02.පිරිවැය හා සුන්බුන් අගය සහ ක්ෂය ප්‍රතිශතය දී ඇති විට.

වාර්ෂික ක්ෂය ප්‍රමාණය = (පිරිවැය - සුන්බුන් අගය) * ක්ෂය අනුපාතය

03. පිරිවැය සහ ඵලදායි ජීව කාලය දී ඇති විට.

වාර්ෂික ක්ෂය ප්‍රමාණය = පිරිවැය/ ඵලදායි ජීව කාලය

04. පිරිවැය හා ඵලදායි ජීව කාලය සහ සුන්බුන් අගය දී ඇති විට.

වාර්ෂික ක්ෂය ප්‍රමාණය = පිරිවැය - සුන්බුන් අගය/ ඵලදායී ජීව කාලය

<u>හීන වන ක්ෂය ක්‍රමය</u>

මෙම ක්‍රමයේදී සිදුවන්නේ ක්ෂය වීම් ගණනය කරනු ලබන එකිනෙක වර්ෂයේ ආරම්භක දිනට එම වත්කමේ ශුද්ධ අගය පදනම් කරගෙන ක්ෂය ගණන් බැලීමයි. ශුද්ධ අගය ලෙසද සලකනු ලබන්නේ එම වත්කමේ පිරිවැය ප්‍රමාණයෙන් එම වර්ෂය ආරම්භයේ තිබෙන මුළු සමුච්චිත ක්ෂය ප්‍රමාණය අඩු කල පසු ලැබෙන අගයයි.

පිරිවැය, සමුච්චිත ක්ෂය, ක්ෂය අනුපාතය දී ඇති විට,

වාර්ෂික ක්ෂය ප්‍රමාණය = (පිරිවැය - සමුච්චිත ක්ෂය) * ක්ෂය අනුපාතය

- අබ්දුල් ව්‍යාපාරයේ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ තොරතුරු සමුහයක් පහත දැක්වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 650,000 | |
| මෝටර් රථ | 230,000 | |
| ලී බඩු | 25,000 | |
| ක්ෂය වෙන්කිරීම 2015.04.01 දිනට | | |
| ඉඩම් හා ගොඩනැගිලි | | 6,500 |
| මෝටර් රථ | | 46,000 |
| ලී බඩු | | 1,250 |
| කොමිස් | 5,600 | |
| ණය ගැතියෝ | 12,500 | |
| ණයහිමියෝ | | 2,300 |
| විකුණුම් | | 45,800 |
| 2015.04.01 තොගය | 12,000 | |
| ආපසු එවුම් | 6,000 | |
| ගැනුම් | 295,000 | |
| ගෙන ඒමේ කුලී | 2,580 | |
| විගණන ගාස්තු | 14,500 | |
| ආයෝජන | 56,000 | |
| විකුණුම් කොමිස් | | 3,000 |
| ණය පොලි | 650 | |
| රක්ෂණ | 2,500 | |
| විදුලිය | 1,200 | |

| | | |
|---|---|---|
| සේවක භාරකාර අරමුදල් වියදම් | 900 | |
| ලැබූ කඩ කුලී | | 3,650 |
| මුදල් වංචා | 7,000 | |
| ගැනිලි | 25,800 | |
| ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | 900 | |
| දුන් වට්ටම් | 2,500 | |
| බැංකු ශේෂය | 365,000 | |
| ගෙනයාමේ වියදම් | 2,500 | |
| ලී බඩු අලුත්වැඩියා වියදම් | 5,800 | |
| වැටුප් හා වේතන | 45,800 | |
| කීර්තිනාමය | 12,000 | |
| ගෙවල් කුලී | 12,500 | |
| වරිපනම් | 6,000 | |
| විවිධ වියදම් | 2,150 | |
| සේවක අර්ථසාධක අරමුදල් වියදම් | 2,500 | |
| දුරකථන ගාස්තු | 29,700 | |
| අපසු යැවුම් | | 2,560 |
| ණය - 5 % | | 6,500 |
| ප්‍රාග්ධනය | | 976,320 |
| | 1506,080 | 1506,080 |

පහත සඳහන් තොරතුරු ද සපයා ඇත.

01. 2016.03.31 දිනට බඩු තොගය රු. 40,000 කට තක්සේරු කර ඇත.

02. පහත පරිදි ක්ෂය ගැලපිය යුතු ය.

ඉඩම් හා ගොඩනැගිලි 10%

මෝටර් රථ 20%

ලී බඩු - හීනවන ක්ෂය ක්‍රමය 5%

03. ගැනිලි සිදුවුයේ මෙසේය.

භාණ්ඩ ගැනිලි රු. 650

මුදල් ගැනිලි රු. 950

04. ලැබිය යුතු කඩකුලී මුදල මසකට රු. 350 කි.

05. කලින් ලැබූ විකුණුම් කොමිස් මුදල රු. 500 කි.

06. 2016.03.31 දිනට ගෙවිය යුතුව තිබු වියදම්

ලී බඩු අලුත්වැඩියා වියදම් රු.3100

වැටුප් හා වේතන රු. 9500

ගෙනයාමේ වියදම් රු. 9700

07. ඉදිරි වර්ෂය සඳහා 2016.03.31 දිනට ගෙවා ඇති වියදම් මෙසේය.

වරිපනම් රු. 750

රක්ෂණය රු. 600

ඔබ විසින්

01. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

02. 2016.03.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

❖ නිරෝමා ව්‍යාපාරයේ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ තොරතුරු සමුහයක් පහත දැක්වේ.

| | හර රු. | බැර රු. | | හර රු. | බැර රු. |
|---|---|---|---|---|---|
| විකුණුම් | | 850,000 | ගෙන ඒමේ කුලී | 500 | |
| ආපසු එවුම් | 25,600 | | තීරු ගාස්තු | 56,000 | |
| මුල් තොගය | 2,500 | | ගුදම් ගාස්තු | 600 | |
| ගැනුම් | 556,000 | | ආපසු යැවුම් | | 2,300 |
| මෝටර් රථ | 582,100 | | ගැනිලි | 12,000 | |
| ලද විකුණුම් කොමිස් | | 900 | කාර්යාල උපකරණ | 5,800 | |
| ලද වට්ටම් | | 900 | ගොඩනැගිලි අලුත්වැඩියා | 6,300 | |
| ලැබූ ණය පොලි | | 800 | ලී බඩු අලුත්වැඩියා වියදම් | 8,900 | |
| ලී බඩු | 25,400 | | අමතර ප්‍රාග්ධනය | | 9,600 |
| ලැබූ කොමිස් | | 2,500 | උකස් ණය පොලී | 20,000 | |
| බැංකු ගාස්තු | 1,200 | | විකුණුම් සේවක කොමිස් | 8,500 | |
| වැටුප් හා වේතන | 56,000 | | ප්‍රචාරණ වියදම් | 6,300 | |
| ණය ගැතියෝ | 69,800 | | බැංකු මුදල් | | 89,500 |
| ගෙවල් කුලී හා වරිපනම් | 36,500 | | දුන් වට්ටම් | 3,600 | |
| රක්ෂණ | 9,800 | | ගෙනයාමේ වියදම් | 4,000 | |
| ණය හිමියෝ | | 45,800 | ආයෝජන | 2,500 | |
| විදුලිය හා දුරකථන | 8,900 | | මෝටර් රථ අලුත්වැඩියා | 800 | |
| නීති ගාස්තු | 6,500 | | මුදල් වංචා | 300 | |
| විගණන ගාස්තු | 9,800 | | උකස් ණය - 5% | | 555,300 |

| | | | | | |
|---|---|---|---|---|---|
| බැංකු ණය - 20% | | 89,700 | ණය - 10% | 25,000 | |
| ප්‍රාග්ධනය | | 466,000 | ඉඩම් හා ගොඩනැගිලි | 562,100 | |

පහත සඳහන් තොරතුරු ද සපයා ඇත.

01. 2015.03.31 දිනට බඩු තොගය රු.6500 කට තක්සේරු කර ඇත.

02. 2015.03.31 දිනට ගෙවිය යුතුව තිබු වියදම්

ගෙවල් කුලී හා වරිපනම් රු. 300

මෝටර් රථ අලුත්වැඩියා ගාස්තු රු. 500

ප්‍රචාරණය රු. 900

03. ඉදිරි වර්ෂය සඳහා 2015.03.31 දිනට ගෙවා ඇති වියදම් මෙසේය.

වැටුප් හා වේතන රු. 6,000

රක්ෂණ රු. 810

04. පහත පරදී ක්ෂය ගැලපිය යුතුය.

ඉඩම් හා ගොඩනැගිලි 10%

කාර්යාල උපකරණ - හීනවන ක්ෂය ක්‍රමය 10%

ලී බඩු 5%

මෝටර් රථ 12%

05. ගැනිලි සිදු වුයේ මෙසේය.

භාණ්ඩ ගැනිලි රු. 600

මුදල් ගැනිලි රු. 800

ඔබ විසින්

01. ගැලපුම් අංක 04 හා 05 සටහන් කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්

02. 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභලාභ ගිණුම

03. 2015.03.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

## <u>බොල්ණය හා අඩමාන ණය ගැලපීම.</u>

ව්‍යාපාරයේ භාණ්ඩ හා සේවා ණයට ගත් පුද්ගලයෝ (ණයගැතියෝ) ව්‍යාපාරයට එම ණය මුදල් නොගෙවීම ව්‍යාපාරයට පාඩුවකි. මෙසේ ණය නොගෙවීම මත ඇති වන වියදම බොල්ණය ලෙස අදහස් වේ.

<u>බොල්ණය ගිණුම් ගත කිරීම</u>

බොල්ණය ගිණුම හර ⟶ මෙය අදායම් ප්‍රකාශයේ බෙදාහැරීමේ වියදම් වල දක්වයි.

ණය ගැතියෝ ගිණුම බැර ⟶ මෙය ශේෂ පත්‍රයේ ණය ගැතියන්ගෙන් අඩු කර දක්වයි.

### ඇයි ? බොල්ණය වියදමකි.

බොල්ණය වීම නිසා ණය ගැතියන්ගෙන් අපිට අය විය යුතු වටිනාකම අඩු වන බැවින් ණයගැතියන්ගෙන් අඩුකර දක්වයි.

<u>කපා හල බොල් ණය නැවත ලැබීම.</u>

01. ණය ගැතියා නගා සිටුවීම.

ණය ගැති ගිණුම හර
බොල්ණය ගිණුම බැර

02. මුදල් ලැබීම.

මුදල් / බැංකු ගිණුම හර
ණයගැති ගිණුම බැර

**මෙහි සාරාංශය**

මුදල් / බැංකු ගිණුම හර
බොල්ණය ගිණුම බැර

මුදල් හර වන බැවින් ශේෂ පත්‍රයේ මුදල් වලට එකතු කරයි. බොල්ණය බැර වන බැවින් බොල්ණය වියදම අඩු කරයි.

<u>අඩමාණ ණය වෙන් කිරීම.</u>

ව්‍යාපාරයට මුදල් ලැබීමට ඇති ණය ගැතියන්ගෙන් ඉතිරි කලපරිච්ඡේද වලදී මුදල් අයකර ගැනීමේදී කිසියම් මුදල් වටිනාකමක් නොලැබේ යැයි සිතුනොත්, ඒ සඳහා වෙන් කිරීම මෙය වේ.

**අඩමාණ ණය වෙන්කිරීම ගණනය කරන ක්‍රමය**

01.නිශ්චිත වෙන් කිරීමේ ක්‍රමය.
එනම් වර්ෂය අවසයේදී බොල්ණය කපාහල පසු ණය ගැතියන්ගේ ශේෂ ලැයිස්තුව අධ්‍යයනය කොට දිගුකාලයක් තිස්සේ නොගෙවා ඇති ණය ගැතියන් තෝරාගෙන ඔවුන් සඳහා නිශ්චිත වෙන් කිරීමක් කිරීම.

02.පොදු වෙන් කිරීම.
එනම් වර්ෂය අවසානයේදී බොල්ණය කපහැරීමෙන් හා නිශ්චිත වෙන් කිරීමෙන් පසු ණයගැතියන්ගේ ශේෂයෙන් යම් ප්‍රතිශතයක් උදා : 10% ක්, 5% ක්, වර්ෂයෙන් ගණනය කොට වෙන් කිරීම් පවත්වා ගැනීමයි.

**අඩමාණ ණය ගිණුම් තැබීම.**

<u>01. ඌණ අඩමාණ ණය වෙන් කිරීම.</u>

අඩමාණ ණය ගිණුම හර ආදායම් ප්‍රකාශයේ බෙදාහැරීමේ වියදම් වල දක්වයි.
අඩමාණ ණය වෙන් කිරීමේ ගිණුම බැර ශේෂ පත්‍රයේ ණය ගැතියන්ගෙන් අඩු කර දක්වයි.

<u>02. අධි අඩමාණ ණය වෙන් කිරීම.</u>

අඩමාණ ණය වෙන් කිරීමේ ගිණුම හර ශේෂ පත්‍රයේ ණය ගැතියන්ගෙ දක්වයි.
අඩමාණ ණය ගිණුම බැර ආදායම් ප්‍රකාශයේ බෙදාහැරීමේ වියදම් වල දක්වයි.

- 2016.03.31 දිනට මාරවිල ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | රු. | රු. |
|---|---:|---|
| ණය ගැතියෝ | 60,000 | |
| 2015.04.01 දිනට අඩමාණ ණය වෙන්කිරීම | 3,000 | |
| බොල්ණය | 400 | |

අතිරේක තොරතුරු

01. බොල්ණය රු.5,000 ක් ණය ගැතියන්ගෙන් කපා හැරීමට කළමනාකරණය තීරණය කර ඇත.

02. අඩමාණ ණය සඳහා ණය ගැතියන්ගෙන් 10%ක වෙන්කිරීමක් කරයි.

අවශ්‍ය වන්නේ

01. ජර්නල් සටහන්

02. 2016.03.31 දිනට අදායම් ප්‍රකාශය හා ශේෂ පිරික්සුමේ උද්ධෘතයන්

❖ 2016.03.31 දිනට SHEY ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත දක්වා ඇත.

| | රු. | රු. |
|---|---|---|
| ණයහිමියෝ<br>2015.04.01 දිනට අඩමාණ ණය වෙන්කිරීම<br>බොල්ණය<br>මුදල් | 20,000<br>3,000<br>4,000<br>3,000 | |

අතිරේක තොරතුරු

01. රු.3000 ක් බොල්ණය ලෙස ණය ගැතියන්ගෙන් කපා හරින ලදී.

02. ව්‍යාපාරයේ අඩමාණ ණය වෙන්කිරීම 10% කි.

03. රු.2500ක බොල්ණය කපා හැරීමක් නැවත ව්‍යාපාරයට ලැබිණි.

අවශ්‍ය වන්නේ

01. ජර්නල් සටහන්

02. 2016.03.31 දිනට අදායම් ප්‍රකාශය හා ශේෂ පිරික්සුමේ උද්ධෘතයන්

## ගැලපිල්ල සිදුකිරීමේ පිළිවෙල

බොල්ණය ගැලපිල්ල ⟶ අඩමාණ ණය ගැලපිල්ල

❖ පහත දැක්වෙන්නේ SHEY තනි පුද්ගල ව්‍යාපාරයේ 2016.03.31 දිනට ශේෂ පිරික්සුම වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| බොල්ණය | 17,700 | |
| බැංකු අයිරාව | | 543,200 |
| බැංකු පොලිය | 54,900 | |

| | | |
|---|---|---|
| ගොඩනැගිලි රක්ෂණ | 15,000 | |
| ප්‍රාග්ධන ගිණුම | | 2570,000 |
| ගෙන ඒමේ කුලී | 135,000 | |
| කොමිස් | 18,900 | |
| ලද කොමිස් | | 4,500 |
| ගෙවිය යුතු ගිණුම | | 199,600 |
| ලද වට්ටම් | | 73,000 |
| ගැනිලි | 543,000 | |
| විදුලිය | 435,900 | |
| ස්ථාවර තැන්පතු | 250,000 | |
| ඉඩම් හා ගොඩනැගිලි | 16,000 | |
| මෝටර් වාහන | 1900,000 | |
| මෝටර් වාහන රක්ෂණය | 73,500 | |
| මෝටර් වාහන නඩත්තු | 159,600 | |
| මෝටර් වාහන ක්ෂය වෙන්කිරීම 2014.04.01 දිනට | | 380,000 |
| අඩමාණ ණය සඳහා වෙන්කිරීම 2014.04.01 දිනට | | 10,800 |
| ගැනුම් | 2990,000 | |
| වරිපනම් | 9,600 | |
| ලද කඩ කුලී | | 24,000 |
| වැටුප් හා වේතන | 288,000 | |
| විකුණුම් | | 6569,000 |
| විකුණුම් ආපසු එවුම් | 36,000 | |
| බඩු තොගය 2014.04.01 දිනට | 679,000 | |
| විවිධ වියදම් | 18,000 | |
| ලැබිය යුතු ගිණුම | 24,000 | |
| | 9,462,600 | 9,462,600 |

පහත සඳහන් තොරතුරු ද සපයා ඇත.

01. 2015.03.31 දිනට බඩුතොගය රු. 175,000 කි.

02. පහත පරිදි ක්ෂය ගැලපිය යුතුය.

ඉඩම් හා ගොඩනැගිලි 5%

මෝටර් රථ - හීන වන ක්ෂය ක්‍රමය 10%

03. බොල්ණය ලෙස රු. 250 ක් ණය ගැතියන්ගෙන් ස්ථිර වශයෙන් කපා හැරීමට කළමනාකරණය තීරණය කරන ලදී.

04. අඩමාණ ණය ඉතිරි ණය ගැතියන්ගෙන් 10%ක් වෙන් කිරීමට ද කළමනාකරණය තීරණය කරන ලදී.

05. ලැබිය යුතු ගෙවල් කුලිය මසකට රු.2500 කි.

06. අයිතිකරු රු.2500 ක් හා රු. 2560ක් පිළිවෙලින් මුදල් හා භාණ්ඩ තම ප්‍රයෝජනය සඳහා රැගෙනගොස් ඇත.
07. කාලින තැන්පතු සඳහා වාර්ෂික පොලි අනුපාතිකය 20% කි.

ඔබ විසින්

01. ගැලපුම් අංක 03 හා 04 සටහන් කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්
02. 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම
03. 2015.03.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

❖ තරංග ව්‍යාපාරයේ පොත්වලින් 2015.12.31 දිනට උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුම පහත දැක්වේ.

රු. 000

| | හර | බැර |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි - පිරිවැයට | 150,000 | |
| ගෘහ භාණ්ඩ - පිරිවැයට | 80,000 | |
| යන්ත්‍රෝපකරණ - පිරිවැයට | 120,000 | |
| මෝටර් රථ - පිරිවැයට | 10,000 | |
| 2015.01.01 දිනට ක්ෂය වෙන් කිරීම | | |
| ඉඩම් හා ගොඩනැගිලි | | 20,000 |
| ගෘහ භාණ්ඩ | | 10,000 |
| යන්ත්‍රෝපකරණ | | 60,000 |
| මෝටර් රථ | | 25,000 |
| ණය ගැතියෝ | 30,000 | |
| ණයහිමියෝ | | 25,000 |
| දුන් වට්ටම් | 2,000 | |
| ලද වට්ටම් | | 3,000 |
| ප්‍රවාහන වියදම් | 2,800 | |
| විදුලිය | 1,400 | |
| මෝටර් රථ අලුත්වැඩියා | 3,000 | |
| වරිපනම් | 2,200 | |
| රක්ෂණ | 1,800 | |
| කාර්යාල වියදම් | 4,200 | |
| වේතන හා වැටුප් | 15,300 | |
| විකුණුම් | | 250,000 |
| ගැනුම් | 72,000 | |
| ආපසු එවුම් | 1,400 | |
| ආපසු යැවුම් | | 4,200 |

| | | |
|---|---|---|
| ගෙන ඒමේ කුලී | 4,200 | |
| පොදු වියදම් | 8,200 | |
| ප්‍රචාරණය | 4,900 | |
| 15% ණය | | 85,000 |
| 2015.01.01 දිනට බඩු තොගය | 12,500 | |
| බැංකු අයිරාව | | 28,000 |
| මුදල් ශේෂය | 6,300 | |
| ප්‍රාග්ධනය | | 112,000 |
| | 622,200 | 622,200 |

පහත සඳහන් තොරතුරු ද සපයා ඇත.

01. 2015.12.31 බඩුතොගය රු. 28,000,000 කට තක්සේරු කර ඇත.

02. 2012.12.31 දිනට ගෙවිය යුතුව තිබූ වියදම්

විදුලිය රු. 1,200,000

ප්‍රවාහන ගාස්තු රු. 800,000

වරිපනම් රු. 400,000

03.ඉදිරි වර්ෂය සඳහා 2015.12.31 දිනට ගෙවා ඇති වියදම් මෙසේය.

ප්‍රචාරණය රු. 600,000

රක්ෂණය රු. 800,000

04. ණය මුදල ලබාගන්නා ලද්දේ 2015.10.01 දින දීය. ණය පොලිය උපචිතව ඇත.

05. බොල්ණය ලෙස රු. 250,000ක් ණය ගැතියන්ගෙන් ස්ථිර ලෙස කපා හැරීමට කළමනාකරණය තීරණය කරන ලදී.

06. අඩමාණ ණය ඉතිරි ණය ගැතියන්ගෙන් 10%ක් වෙන්කිරීමටද කළමනාකරණය තීරණය කරන ලදී.

07. ඉඩම් හා ගොඩනැගිලි, ගෘහ භාණ්ඩ යන මේවා සරල මාර්ග ක්‍රමය මත පිලිවෙලින් 2% හා 5% බැගින් ද යන්ත්‍රෝපකරණ හා මෝටර් රථ හීන වන ශේෂ ක්‍රමය මත පිලිවෙලින් 10% හා 20% බැගින්ද වාර්ෂිකව ක්ෂය කල යුතුය.

ඔබ විසින්

01.2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

02. 2015.03.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න

**<u>වට්ටම් සඳහා වෙන්කිරීම.</u>**

එනම් ව්‍යාපාරයට මුදල් ලැබෙන ණය ගැතියන්ගෙන් ඉදිරි කලපරිච්චේදය තුලදී ඉක්මනින් මුදල් අයකර ගැනීමේදී දීමට සිදුවෙතැයි අපේක්ෂා කරන දුන් වට්ටම් වෙනුවෙන්, ඉදිරි කලච්චේදයේ සිදුවීමට ඉඩ ඇති දුන් වට්ටම් අලාභ වර්තමාන ලාභයෙන් කපා හැරීමේ ක්‍රමය මෙය වේ.

ලාභාලාභ ගිණුම හර
දුන්වට්ටම් වෙන්කිරීමේ ගිණුම බැර වේ.

## අවසාන ගිණුම් වලට සම්බන්ධ වන අයුරු

බොල්ණය ගැලපිල්ල ⟶ අඩමාණ ණය ගැලපිල්ල සිදුකිරීමෙන් පසුව ණයගැති ශේෂය මත වට්ටම් වෙන්කිරීමේ ප්‍රතිශතය ගලපා මුලින්ම වට්ටම් වෙන්කිරීම ගණනය කර ගත යුතුය.එසේ ගණනය කරගත් වට්ටම් වෙන්කිරීම ශේෂ පත්‍රයේ ණය ගැති ශේෂයෙන් අඩුකොට ශේෂ පිරික්සුමේ වට්ටම් වෙන්කිරීම සමග සංසන්දනය කර අධි වෙන්කිරීමක් නම් එය බෙදාහැරීමේ වියදම් වලින් අඩුකොට පෙන්විය යුතු අතර ඌන වෙන්කිරීමක් නම් බෙදාහැරීමේ වියදම් තුල ඇතුලත් කල යුතුය.